**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජූලි 2011

## (53) ව්‍යාපාර අධ්‍යයනය
(Business Studies)

විෂය නිර්දේශය බොහෝ කොටස් ආවරණය වන පරිදි ප්‍රශ්න පත්‍රය පිළියෙල කර තිබුණි. සමස්ථයක් වශයෙන් සලකා බලන විට මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ සාධන මට්ටම සතුටුදායක තත්ත්වයක පැවතුනි. එහෙත් ඇතැම් අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බව පැහැදිලි විය. එක් එක් ප්‍රශ්නය වෙන් වශයෙන් ගෙන සලකා බැලීමේදී උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ අවධානයට ලක්වූ වැදගත් කරුණු පහත දැක්වේ.

## A - කොටස

### ප්‍රශ්න අංක 01 - ලකුණු 40
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නය අනු කොටස් 20 කින් යුක්ත බහුවරණ ප්‍රශ්නයකි. එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු ප්‍රමාණය 40 කි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම එතරම් සතුටුදායක නැත.

අනු අංක B, G, I, M, P යන කොටස් වලට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන් ස්වල්ප දෙනෙක් පමණි.

## B කොටස

### ප්‍රශ්න අංක 02 - ලකුණු 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) අභ්‍යන්තර හා බාහිර වෙළදාම පිළිබඳව කෙටියෙන් පැහැදිලි කල යුතුව තිබුන නමුත් ඒ පිළිබඳව අයදුම්කරුවන්ගේ අවබෝධය ප්‍රමාණවත්ව තිබුණේ නැත. අභ්‍යන්තර වෙළෙඳාම ව්‍යාපාරය තුල සිටින පාර්ශව අතරත් බාහිර වෙළෙඳාම වෙනත් ව්‍යාපාර සමගත් කෙරෙන වෙළදාම් ලෙස බෙහෝ අයදුම්කරුවන් ලියා තිබුණි. සමහර අයදුම්කරුවන් නිවැරදි උදාහරණ සපයමින් පැහැදිලි කොට සම්පූර්ණ ලකුණු ලබා තිබුණි.

(b) තොග වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාම අතර වෙනස සාර්ථකව ලියා බොහෝ අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ප්‍රමාණ ලබා තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙහි මූලිකම වෙනස වන "භාණ්ඩ මිලදී ගැනීමේ අරමුණු චේතනාව" පිළිබඳව නොදන්නා බවක් පෙනුණි.

(c) නිස්කර්ශක කර්මාන්ත පැහැදිලි කිරීමට අදාල වූ මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් ලකුණු ලබා තිබුණත් ඇතැම් අය නිස්කර්ශක කර්මාන්ත පැහැදිලි කිරීම අසාර්ථක වී තිබුණි. මෙහිදී "ස්වභාවධර්මයෙන් ලැබී තිබෙන ද්‍රව්‍ය කිසිදු වෙනස් කිරීමකට භාජනය නොකර" යන්න බොහෝ අයදුම්කරුවන් ලියා තිබුණත් ඒවා මිනිස් ශ්‍රමය භාවිත කොට උකහා ගැනීම" කරන බව ලියා නොතිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියේ දැක්වෙන ප්‍රධාන මූලධර්ම 5 ක් සඳහන් කර මුළු ලකුණු ලබා ගැනීමට බොහෝ අයදුම්කරුවන්ට හැකිවිය. එහෙත් සමහර අයදුම්කරුවන්ට 24 වන වගන්තියේ ඇතුලත් කරුණු පිළිබඳ නිරවුල් අවබෝධයක් නොමැති වීමෙන් සාමාන්‍ය හවුල් ගිවිසුමක ඇතුලත් වන කරුණු සඳහන් කල අවස්ථාද දක්නට ලැබුණි.

(b) වගකීම සීමිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කල යුතු ලියවිලි වලින් කිහිපයක් පමණක් බොහෝ අයදුම්කරුවන් ලියා තිබුනද සම්පූර්ණ පිළිතුර දී තිබුණේ ඉතා අඩු අයදුම්කරුවන් පිරිසකි. බොහෝ අයදුම්කරුවන් පැරණි සමාගම් ආඥා පනතේ සඳහන් කරුණු ලියා තිබුණි.

(c) රන් කොටස් (golden share) සම්බන්ධයෙන් බොහෝ අයදුම්කරුවන් තුල කිසිදු අවබෝධයක් නොමැති බව පෙනී යයි. සමහරු මේවා රත්රන් කොටස් බවත් එබැවින් ඒවා ඉහළ වටිනාකමින් යුක්ත බවත් ශ්‍රී ලංකා මහ බැංකුව හා මහා භාණ්ඩාගාරය මේවා නිකුත් කරන බවත් ලෙස වැරදි පිළිතුරු ලියා තිබුණි. අයදුම්කරුවන් තුල පැහැදිලි අවබෝධයක් හා දැනුමක් නොමැති වීම නිසා මෙම කොටසට ලකුණු ලබා ගැනීමට අසමත් විය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) ගනුදෙනු කල හැකි උපකරණ නිර්වචනය කිරීම බොහෝ අයදුම්කරුවන්ට අපහසු වුවත් වෙළෙඳපොලේ පවත්නා ගනුදෙනු කල හැකි ප්‍රධාන උපකරණ නිවැරදිව නම්කොට තිබුණි. සමහර අයදුම්කරුවන් "උපකරණ" යන්න වරදවා තේරුම්ගෙන "ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර" වැනි උපකරණ වැනි වැරදි පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබා තිබුණේ ඉතා සුළු ප්‍රමාණයකි.

(b) මධ්‍යම තැන්පතු ක්‍රමය (Central Depositary System) යනු කුමක්ද යන්නත් මධ්‍යම තැන්පතු ක්‍රමයට සම්බන්ධ වන්නේ කවුරුන්ද යන්නත් පිළිබඳව අයදුම්කරුවන් බොහෝ දෙනෙක් තුල නිවැරදි අවබෝධයක් නොතිබූ අතර මෙම කොටසට පිළිතුරු දීමෙන් බොහෝ දෙනෙක් වැළකී සිටියහ.

(c) වෙළෙඳ පොළ සහභාගිවන්නන් තත්කාලීන දළ බේරුම් කිරීමේ පද්ධතිය (Real Time Gross Settlements System) මගින් අත්කර ගන්නා වාසි පිළිබඳව එම ක්‍රමය පිළිබඳව නිසි අවබෝධයකින් තොරව උපකල්පිත සංකල්ප අනුව බෙහෝ දෙනෙකු වැරදි පිළිතුරු දී තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) "මිලන්කා කොටස් මිල දර්ශකය" සහ "සමස්ථ කොටස් මිල දර්ශකය" අතර වෙනස්කම් පැහැදිලි කිරීමේදී මේ දෙක අතර ප්‍රධාන වෙනස බොහෝ අයදුම්කරුවන් දැනසිටි අතර විශේෂයෙන් මිලන්කා මිල දර්ශකය ගැන වෙනත් වෙනස්වීම් දැක්වීමට අසමත් වී තිබුණි. කෙසේවෙතත් මෙම කොටසට පිළිතුරු සැපයූ අයදුම්කරුවන් බොහෝ දෙනෙක් අඩු ලකුණු ලබා තිබුණි.

(b) වෙනත් ආයෝජන මාර්ගවල ආයෝජනය කරනවාට වඩා සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් අත්වන ප්‍රධාන වාසි පිළිබඳව මෑත විභාග අවස්ථා ගණනාවකදී පරීක්ෂා කෙරුනු අතර බොහෝ අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි. එහෙත් ඇතැම් අයදුම්කරුවන් එතරම් වැදගත් නොවන කරුණු රාශියක් දක්වා තිබුණි.

(c) රජයේ සුරැකුම්පත් විකිණීම සඳහා පවත්නා ප්‍රති විකිණුම් (Repo) හා ප්‍රති මිලදී ගැනීමේ (Reverse repo) කවුළු කෙටියෙන් පැහැදිලි කරන ලෙස දක්වා ඇති ප්‍රශ්නය පිළිබඳව බොහෝ අයදුම්කරුවන් තුල නිසි අවබෝධයක් නොමැති බව දී ඇති පිළිතුරු වලින් පෙනී යයි. තරමක් හෝ සාර්ථක පිළිතුරු සපයා ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙක් පමණි.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ඇතුලත් වන අයිතම පහක් (05) දැක්වීමට නියමිත වුවත් බොහෝ අයදුම්කරුවන්ට ගෙවුම් ශේෂ ලේඛනය පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොතිබූ බව පැහැදිලිව පෙනුණි. සමහර අයදුම්කරුවන් ගිණුම්කරණයට අදාලව නොයෙකුත් උපකල්පිත කරුණු අනුව වැරදි පිළිතුරු ලියා තිබුණි.

(b) මෙම කොටසින් ගෙවුම් ශේෂ අතිරික්තයක් හෝ හිඟයක් හඳුනාගන්නා අයුරු විමසා තිබුණි. ඉහත (a) කොටසට මෙන්ම මෙම ප්‍රශ්නයටද සාර්ථක පිළිතුරු ලියා නොතිබුණි. ආදායම වැඩි නම් අතිරික්තයක්ද හා වියදම වැඩිනම් ඌනතාවයක්ද ඇතිවන බව වැනි වැරදි පිළිතුරු ලියා තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට එතරම් ලකුණු ලබා නොතිබුණි.

(c) වෙළෙඳ අනුපාතය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්නත් වෙළෙඳ අනුපාතය පිරිහීමට බලපාන සාධක තුනක්(03) දක්වන ලෙසත් මෙම ප්‍රශ්නයේ සඳහන් කර ඇති අතර වෙළෙඳ අනුපාතය නිවැරදි ලෙස හඳුන්වා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි. බොහෝ දෙනෙක් වෙළෙඳ අනුපාතය ගණනය කරන ආකාරය නිවැරදිව දක්වා ඇතත් වෙළෙඳ අනුපාතය පිරිහීමට බලපාන සාධක සඳහන් කර තිබුණේ ටික දෙනෙක් පමණි.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට බොහෝ අයදුම්කරුවන් උත්සාහ කල ප්‍රශ්නයකි. කෙසේවෙතත් පිළිතුරු එතරම් සාර්ථක මට්ටමක නොතිබුණි.

(a) **නිශ්ක්‍රීය හවුල්කරු (Sleeping Partner)** බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලියා සම්පූර්ණ ලකුණු ලබා තිබුණි.

(b) **සංවර්ධන බැඳුම්කර (Development Bonds)** පිළිබඳ නිසිලෙස අවබෝධ කොටගෙන නොතිබුණි. බොහෝ අයදුම්කරුවන් භාණ්ඩාගාර බැඳුම්කර සංවර්ධන බැඳුම්කර ලෙස හඳුනාගෙන වැරදි පිළිතුරු දී තිබුණි.

(c) **අයිතිවාසිකම් නිකුතුව (Right Issue)** මෙම කොටසටද සාර්ථක පිළිතුරු ලියා නොතිබුණි. විවිධ උපකල්පන මත වැරදි පිළිතුරු ලියා තිබුණි. සමහරු එය හඳුන්වා තිබුණේ අයිතිය වෙනුවෙන් නිකුත් කරනු ලබන ලියවිල්ලක් ලෙසය.

(d) **මූල්‍ය ව්‍යුත්පන්න උපකරණ (Financial Derivatives)** මෙම කොටස සඳහා බොහෝ අයදුම්කරුවන් ලකුණු ලබා නොතිබුණි. බොහෝ අයදුම්කරුවන් මේ පිළිබඳව නිසි අවබෝධයකින් තොරව පිළිතුරු සපයා ඇති බව නිරීක්ෂණය විය.

(e) **ප්‍රපාතනය (Dumping)** බොහෝ අයදුම්කරුවන් තුල පැහැදිලි අවබෝධයක් තිබුණි. එහෙයින් ප්‍රමාණවත් ලකුණු ලබා තිබුණි.

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. ප්‍රශ්න පත්‍රය ආරම්භයේ දී ඇති උපදෙස් හොඳින් සැලකිලිමත්ව කියවා අනිවාර්ය ප්‍රශ්න සහ තෝරා ගතහැකි ප්‍රශ්න මොනවාද යන්න පිළිබඳව අවබෝධ කර ගත යුතුය.

2. ප්‍රශ්නය කීපවරක් හොඳින් කියවා මැනැවින් අවබෝධ කර ගෙන අසා ඇති කරුණු වලට පමණක් පිළිතුරු සැපයිය යුතුය. අදාල නොවන කරුණු ඇතුලත් නොකළ යුතුය.

3. පිළිතුරු සැපයීමේදී කාලය බෙදාගැනීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

4. අත්අකුරු පැහැදිලිව ලිවීම මගින් පරීක්ෂකවරයාට උත්තර පත්‍රය කියවා හොඳින් අවබෝධ කරගැනීමට සැලැස්වීමෙන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට හැකිවනු ඇත.

5. කලින් වසරවල විභාග ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමෙන් විෂය දැනුම වර්ධනය කර ගැනීමටත්, වේගවත්ව පිළිතුරු සැපයීමේ නිපුණතාව ඇතිකර ගැනීමටත් හැකියාව ලැබේ.

6. දැනුම යාවත්කාලීන කර ගැනීම සඳහා අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ.

- * * * -